# සංස්කෘතියෙහි ප්‍රධාන සංරචකය

සතිඅන්ත කසිකබල් පුවත්පතක කතුවරයකු තමන් ගුණදාස අමරසේකර මහතා හා මා අතර පැවති සුහද හමුවක දී ඇතිවී යැයි කියන සංවාදයක් පිළිබඳ සටහනක් කර තිබෙනු දුටුවෙමි. එහි දී ඔහු මගේ න්‍යායක් යැයි සඳහන්කරන ප්‍රධාන සංරචකය ගැන කියමින් ගොඩ ලොකු වූ පමණින් ප්‍රධාන සංරචකය වන්නේ නම් සිංහල බෞද්ධකම ගැන පමණක් කතා නොකර කුලය ද එයට එකතු කර ගත යුතු නොවේ දැයි ප්‍රශ්න කෙළේලු. එවිට ගුණදාස අමරසේකර මහතා සතුටින් සිනහ වූ නමුත් මා අසන්තෝෂ වූ බව ඔහු කියයි.

මෙවැනි සංවාදයක් පිළිබඳ මට මතකයක් නැත. එහෙත් එපමණකින් එවැන්නක් සිදු නොවී යැයි මම නො කියමි. එහෙත් මට කිවහැකි කරුණක් වෙයි. ඒ මා අසන්තෝෂ වූයේ නම් එසේ වන්නට ඇත්තේ සංකල්ප ගැන අවබෝධයක් නොමැති මුග්ධයකු සමග එවැනි සංවාදයක යෙදීමට සිදුවීම පිළිබඳව ය. ප්‍රධාන සංරචකය යන්න අප යොදාගන්නේ සංස්කෘතිය සම්බන්ධයෙනි. එහෙත් එය කිසිසේත්ම ලොකු ගොඩක් ගැන කියවෙන්නක් නො වෙයි. අනෙක් අතට ප්‍රධාන සංරචකය යන්න න්‍යායක් නො වෙයි. න්‍යාය යනු ලොජික් යන ඉංගිරිසි වචනයෙන් කියැවෙන්න ය. බොහෝ දෙනා න්‍යාය යන්න ඒ අරුතින් යොදන බව සැබෑ නමුත් අප ඒ යොදාගන්නේ ඒ ආකාරයෙන් නොවන බව අපේ ලේඛන පරිශීලනය කරන්නෝ දනිති.

කිසිම රටක සංස්කෘතිය සමජාතීය නො වෙයි. කිසිම ජනවර්ගයක හෝ ජාතියක හෝ පවා සංස්කෘතිය සමජාතීය නො වෙයි. සිංහල සංස්කෘතියෙහි වුව ද ප්‍රදේශීය වශයෙන් ගත්කල විවිධතා දැකිය හැකි ය. එසේ වුවත් අපට සිංහල සංස්කෘතිය යැයි කිවහැකි වුවක් හඳුනාගත හැකි ය. ඒ ඒ පුද්ගලයා අනෙක් පුද්ගලයකුගෙන් වෙනස් වූ පමණින් මිනිසුන් යනුවෙන් සත්ව විශේෂයක් නැතැයි ජීව විද්‍යාඥයෙක් නො පවසයි. එහෙත් ඊනියා විද්‍යාත්මක ක්‍රමයක් අනුගමනය කරන්නේ යැයි කියන ඇතැම් බටහිර සමාජ විද්‍යාඥයකු ඒ ඒ පුද්ගලයන් හෝ කුඩා කණ්ඩායම් අතර සංස්කෘතික විවිධත්ව තිබූ පමණින් පොදු සංස්කෘතියක් නැතැයි කියනු දැකිය හැකි ය. මේ බටහිර සමාජ විද්‍යාවන්හි ප්‍රශ්නයක් මිස සංස්කෘතියෙහි ප්‍රශ්නයක් නො වේ.

ඇතැම් බටහිර සමාජ විද්‍යාඥයකු එලෙස කීව ද අපි ඉන් කලබලයට පත් නොවෙමු. බටහිර සමාජීය විද්‍යා බටහිර භෞතික විද්‍යාව පසුපස බඩගාන බව අප කිහිප වතාවක් ම කලින් කියා ඇත. බටහිර සමාජ විද්‍යාඥයකු එසේ කීව ද සිංහල බෞද්ධ යනුවෙන් සංස්කෘතියක් වෙයි. සිංහල බෞද්ධ සංස්කෘතිය යනු සංස්කෘතීන් ගණනාවක් මිශ්‍රවීමෙන් සැදුම් ලත් සංස්කෘතියකි. එහි යක්ෂ, නාග, දේව ආදී සංස්කෘතීන් මෙන් ම භාරතයෙන් ලැබුණු වෛදික සංස්කෘතියක් ද දඹදිවින් ලැබුණු බෞද්ධ සංස්කෘතියක් ද වෙයි. මේ මිශ්‍රණය අවුරුදු දහස් ගණනකට පෙර ආරම්භ වී ඇති බව පැහැදිලි ය. විවිධ සංස්කෘතීන් එකතු වීමෙන් සැදුම් ලත් සංස්කෘතියක ඒ විවිධ සංස්කෘති එහි සංරචක වෙයි. ඒ සංරචක අතරින් එකක් ප්‍රධාන සංරචකය වෙයි.

අද ලංකාවේ ප්‍රධාන ම ප්‍රශ්නය වී ඇත්තේ ඊනියා ජනවාර්ගික ප්‍රශ්නය යි. මෙහි දී නව ජාතියක් නිර්මාණය කිරීමේ ප්‍රශ්නය පැන නගී. බටහිර දේශපාලන විද්‍යාඥයන් පවසන ආකාරයෙන් ජාතික රාජ්‍යයක් ඇතිකර ගැනීමට ඇතැමුන්ට අවශ්‍ය වී ඇත. ඒ කෙසේ වෙතත් අද ලාංකික නමින් සිතන්නෝ මෙරට විරල වෙති. ලාංකික නමින් ජාතියක් ඇත්නම් එහි භාෂාව කුමක්දැයි අසන්නෝ ද වෙති. අපට ලාංකික නමින් ජාතියක් ඇතිකර ගැනීමට අවශ්‍ය ද? එසේ අවශ්‍ය නම් අප ඒ සඳහා කටයුතු කරන්නේ කෙසේ ද?

අද මෙරට ඇත්තේ සිංහල නමින් ජාතියක් හා දෙමළ, මුස්ලිම් ආදී ජනවර්ග ය. සිංහල නමින් ජාතියක් නැතැයි බටහිර සමාජීය විද්‍යාවන් අනුව යමින් ඇතැමකු පැවසීමට ඉඩ ඇත. එහෙත් ජාතිය පිළිබඳ සංකල්ප අනුව පණ්ඩුකාභය රජු දවස මෙරට සිංහල ජාතිය බිහිවීම ආරම්භ විණි යැයි පිළිගත හැකි ය. ඇතැම් පඬියන් ඒ නොපිළිගන්නේ බටහිර රටවල ජාතිය යන්න දහසය වැනි සියවසින් පසුව ඇති වූ නිසා ය. පඬියන්ට අනුව බටහිර ජාතිය යන්න බිහිවීමට පෙර ලංකාවේ ජාතියක් ඇතිවිය නො හැකි ය. අපට කළහැක්කේ ඔවුන්ගේ නිවටකම ගැන අනුකම්පාකිරීම පමණකි. පඬියන්ගේ නිවටකමින් තොරව බැලූ කල වැටහෙන කරුණ නම් පණ්ඩුකාභය රජු දවස

© Prof. Nalin De Silva

යක්ෂ නාග දේව ආදී ගෝත්‍ර ද දඹදිවින් පැමිණි අර්ධ වෛදිකයන් ද එකතු වී සිංහල ජාතිය ගොඩනැගීම ඇරඹූ බව ය. ඉන්පසු දේවානම් පියතිස්ස රජු කල ඒ සිංහලයෝ බෞද්ධ වූහ. හැමුණු රජු කල මෙරට සිංහල බෞද්ධ රාජ්‍යය තහවුරු විය. සිංහල ජාතියට සිංහල සංස්කෘතිය නමින් සංස්කෘතියක් වෙයි. සිංහල සංස්කෘතියෙහි ඉහත සඳහන් ගෝත්‍රවල සංස්කෘතික ලක්ෂණ අඩු වැඩි වශයෙන් දැකිය හැකි ය. එහෙත් මුල දී එහි ප්‍රධාන සංරචකය යක්ෂ සංස්කෘතිය වී යැයි සිතිය හැකි ය. අද වන විට ඒ සංස්කෘතීන් කෙතරම් මිශ්‍ර වී ඇත් ද කිවහොත් සිංහල සංස්කෘතියෙහි ප්‍රධාන සංරචකය කුමක් දැයි ඇසීම තේරුමක් නැති ප්‍රශ්නයක් වෙයි.

සිංහල ජාතිය බිහිවීමෙන් පසුව මෙරටට පිටින් පැමිණියෝ සිංහල සංස්කෘතියට අවශෝෂණය කෙරී සිංහල බවට පත්වූහ. ඇත්තෙන් ම ඔවුහු සිංහල බෞද්ධ වූහ. දහතුන්වැනි සියවසේ දී පවා දකුණු ඉන්දියාවෙන් මෙරටට පැමිණියෝ එසේ අවශෝෂණය කරගනු ලැබූහ. එසේ අවශෝ:ණය කෙරුණු සිංහලයන්ගෙන් පැවතෙන්නන් හා ඉන් පෙර විසූ සිංහලයන්ගෙන් පැවතෙන්නන් අතර අද වන විට වෙනසක් දැකිය හැකි නොවේ. එහෙත් මෙසේ සිංහල වීම ජනවර්ග දෙකක් සම්බන්ධයෙන් ඇණහිට ඇත. ඒ මුස්ලිම් ජනයා හා දෙමළ ජනයා හා සම්බන්ධයෙනි. මෙරට මුස්ලිම් ජනයා අරාබියෙන් පැමිණි වෙලෙන්දන් පිරිසකගෙන් පැවත එන්නන් යැයි කීම සුරංගනා කතාවක් පමණකි. එසේ පැමිණියවුන් සිංහල කතුන් විවාහ කරගත්තේ නම් ඔවුන්ගෙන් පැවතෙන්නන් කල්යැමේ දී සිංහල වීම ස්වාභාවික සංසිද්ධිය වෙයි. එසේ සිංහල වූ පිරිසට අමතරව පසුව දකුණු ඉන්දියාවෙන් දෙමළ කතාකරන ඉස්ලාම් භක්තිකයන් පැමිණ ඇත. අද මෙරට සිටින (මුවර්) මුස්ලිම් ජනයාගේ සම්භවය ඇත්තේ මෙහි ය. මුස්ලිම් ජනයා යනු මුස්ලිම් සංස්කෘතියෙහි ජීවත්වන පිරිස බව මෙහි දී සඳහන්කළ යුතු ය.

මෙරට දෙමළ ජනයාගේ සම්භවය ඇතැමුන් කියන ආකාරයට නොව එළාර රජුගේ කාලයට දිව නොයයි. ආර්ය චක්‍රවර්තීන්ගේ රාජ්‍යයෙහි ද යාපන අර්ධද්වීපයෙහි සිංහලයන් වාසය කර ඇත. එයට අමතර ව මලයාලම් බස කතාකළ කේරළයෙන් පැමිණි වේලක්කාරයෝ ද වූහ. මෙරට යාපන දෙමළ ජනයාගේ සම්භවය ඇත්තේ ලන්දේසි යුගයෙහි ය. ලන්දේසීහු දුම්කොළ වගාවට දකුණු ඉන්දියාවෙන් ගොවීන් ගෙන ආහ. යාපන දෙමළ ජනයා වැඩි වශයෙන් මොවුන්ගෙන් පැවතෙන්නෝ වෙති. යාපන දෙමළ හා තමිල්නාඩු දෙමළ භාෂා අතර වයස් පරතරය සොයාගැනීමෙන් මේ පැහැදිලි වනු ඇත. එමෙන් ම යාපන දෙමළ භාෂාවේ තමිල්නාඩු දෙමළ බසෙහි ඇති ප්‍රමාණයට වඩා මලයාලම් වචන වෙයි.

අද ප්‍රශ්නය වන්නේ දෙමළ හා මුස්ලිම් ජනවර්ග සිංහල ජාතියට අවශෝෂණය කරගත හැකිද යන්න ය. අපට ඉතා පැහැදිලිව පෙනෙන කරුණක් නම් ලන්දේසි කාලයේ හා ඉන්පසුව පැමිණි මැලේ මුස්ලිම් ජනයා අද වන විට සිංහල වෙමින් පවතින බව ය. සිංහල බෞද්ධයෝ මෙන් ම සිංහල ක්‍රිස්තියානීහු ද මෙරට වෙති. දැන් සිංහල ඉස්ලාම් පිරිසක් ද ඇතිවන්නේ නම් එහි ඇති වරදක් නැත. ආන්ද්‍ර ප්‍රදේශයෙන් පැමිණ ඇති තෙළිඟු බස කතාකරන අහිගුණ්ඨික නමින් හැඳින්වෙන පිරිස් ද අද බොහෝ දුරට සිංහල වී ඇත. බර්ගර් යනුවෙන් හඳුන්වනු ලබන අය ද අද සිංහල වී ඇත. එහෙත් දෙමළ හා (මුවර්) මුස්ලිම් ජනයා එසේ සිංහල වී නැත. වර්තමානයේ  ඔවුන් සිංහල කිරීමට කතාකිරීම නිෂ්ඵල ක්‍රියාවකි. මෙරට එක් ජාතියක් ඇතිකළ හැකි මාර්ග දෙකක් වෙයි. එකක් දෙමළ හා මුස්ලිම් ජනයා දැනටත් පවතින සිංහල ජාතියට අවශෝෂණය කිරීම ය. නැත්නම් පොදු සංස්කෘතියක් ඇතිකර ගැනීම ය. අද බටහිර රටවල පොදු සංස්කෘතියක් ඇත. ඒ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය වෙයි. එහි විවිධත්ව නැතිවා නො වේ. එහෙත් ඒ රටවල පුරවැසියන් වන සිංහලයන්ට ද බටහිර පොදු සංස්කෘතිය පිළිගැනීමට සිදුවෙයි. බටහිරයෝ ඔවුන් මත පමණක් නොව ලංකාවේ වෙසෙන අප මත ද ඔවුන්ගේ සංස්කෘතිය පටවති. එහි දී ප්‍රධාන කාර්යයක් කරනුයේ පාසල්, විශ්වවිද්‍යාල හා ජනමාධ්‍ය ය. ලංකාවේ පොදු සංස්කෘතියක් බිහිවීම දැනටමත් ඇරඹී ඇත. විවිධ බටහිර ගැත්තෝ එයට අකුල් හෙළති. මේ පොදු සංස්කෘතියේ ප්‍රධාන සංරචකය සිංහල බෞද්ධ වෙයි. එයට හේතුව සිංහල බෞද්ධයන් සංඛ්‍යාවෙන් වැඩිවීම නො වේ. මෙරට අවුරුදු දහස් ගණනක් තිබී මෙරටට පමණක් ආවේණික අදීන සංස්කෘතිය සිංහල බෞද්ධ වෙයි. සිංහල ක්‍රිස්තියානින් ද සංස්කෘතික වශයෙන් ගත්කල සිංහල බෞද්ධ වීම ඇරඹුණේ හැටදෙකේ වතිකානු සම්මේලනයෙන් පසුව නො වේ. අද සිංහල බෞද්ධ සංස්කෘතිය වර්ධනය කිරීමෙහි ලා සංඛ්‍යාවෙන් අඩුවුව ද සිංහල ක්‍රිස්තියානිහු ද සහභාගි වෙති. මෙය ගොඩ පිළිබඳ ප්‍රශ්නයක් නොව අදාළත්වය පිළිබඳ ප්‍රශ්නයකි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva